රටත් ජාතියත් සම්බුද්ධ ශාසනයත්
බෙදුම්වාදයෙන් හා විෂමාචාරයෙන්
මුදවා ගැනීම උදෙසා

# ව්‍යවස්ථා කුමන්ත්‍රණය පරදවමු!

## ව්‍යවස්ථා කුමන්ත්‍රණයට එරෙහි ජාතික සංවිධාන එකමුතුව

වර්තමාන 'යහපාලන' ආණ්ඩුව විසින් නීතිවේදී ලාල් විජේනායකගේ සභාපතිත්වයෙන් කඩිමුඩියේ පත් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කමිටු වාර්තාව එළි දැක ඇත. ඒ ක්‍රියාවලිය තුළ සිදුකළ මහජන අදහස් විමසීම් හා සෙසු ක්‍රියා විමසා බැලීමේදී අපට වැටහී ගියේ මේ සිදු කරන්නේ 'ළමයා ඉපදුන පසු, ඊට වගකිවයුතු පිරිමියාත් ගැහැණියත් කසාද බන්දා උපන් දරුවාට සුජාතභාවයක් ලබාදෙන්නට උත්සහ කරනවා' වැනි අදහසකි. ඊට හේතු නම්, මේ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය පිටුපස වන අදෘශ්‍යමාන හස්තයන් පිළිබඳ යම් යම් ඉඟි බිඟි, සැක සංකා සමාජයේ උත්පන්න වීමය. ඇතැමුන් කීවේ මේ වනවිටත් ව්‍යවස්ථාව සකසා අවසන් බවය. කොමිශන් සභා ආඥාපනත අනුව පත් නොකළ මේ කමිටුව නීති විරෝධීයැයි ඇතැමෙක් ප්‍රකාශ කරති. එසේ නම් වගකිවයුතු කොමිසමක ස්වරූපයෙන්, ව්‍යවස්ථා සම්පාදනය පිණිස මහජන අදහස් ගන්නෙමුයි කියා රටපුරා සිදු කළේ මගඩි නාටකයක්ද? නෛතික නොමැති නම් මේ කමිටුව, අර ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන විසින් එක් එක් පළාත් වල වැසිකිළි කැසිකිළි, හෝ වෙනත් සනීපාරක්ෂක පහසුකම් ගැන සොයා බැලීමට, මූලික දත්ත සමීක්ෂණයන් කිරීමට පත් කරන කණ්ඩායමක් වැනි අවිධිමත් ව්‍යුහයක්ද?

ව්‍යවස්ථා සංශෝධන සටන් පාඨය මේ රටේ බංකොලොත් දේශපාලන සංස්කෘතියේ 'හිඟන්නාගේ තුවාලය' බවට පත්ව ඇත. මේ රටේ ඓතිහාසික ජාතිය වූ සිංහලයා මුහුණ දෙන අභියෝගත් පොදුවේ සමාජය ඉදිරියේ ඇති ආර්ථික, අධ්‍යාපනික, පාරිසරික, පෝෂණ ආදී කුදු මහත් ගැටළුත් පසෙකලා මේ දේශපාලන මුලාවේ කිසිත් නොදන්නා මුග්ධ ඡන්දදායකයා රවටාලනු පිණිස රටේත් තොපේත් අනාගතය වෙනස් කරලනු පිණිස 'ව්‍යවස්ථා සංශෝධන කළයුතු' බව දිවුරා කියයි. පක්ෂ භේධයෙන්ද, වෙනත් පෞද්ගලික කුහක ආශාවන්ගෙන්ද පිරුණු, දින දින තමා විනාශ වන බව නොදන්නා මුග්ධ අනුගාමිකයෝ හිස් වනා, හුරේ දමා, කතිර ගසා ඒවා අනුමත කරති.

කෙසේ වෙතත් ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය ගැන නිල වශයෙන් මේ රටේ ජනතාව දැනුම්වත් වන්නේ මේ වසර මුළදී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව" විසින් ජාතික පුවත්පත් වල පළ කළ පුවත්පත් දැන්වීම ප්‍රකාරවය. එතැන් සිට

මාස ගණනාවක් රට පුරා මේ 'කොමිසම' ඇවිද්දේ 'මහජන අදහස් ලබා ගැනීමට'ය. එහිදී මේ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ 'යෝජකයන්' වන දෙමළ බෙදුම්වාදයේ නිල නියෝජිතයන් වන දෙමළ ජාතික සංධානයේත්, එහි අනුසාංගික සිවිල් සංවිධානයැයි කියන්නාවූ සමිති සමාගම් වලත් අදහස් උදහස් මහ ඉහලින් පිළිගන්නටද, ඒ යෝජනා නොපමාව ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන්නටත් කටයුතු සම්පාදනය වී තිබුණ බව රහසක් නොවේ. එහෙත් එටේ සෑම දිස්ත්‍රික්කයකම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සාක්ෂි ලබාදුන් බොහෝ මැදහත් පිරිස්ද, සිංහල හා සිංහල බෞද්ධ සංවිධාන හා සිංහල සමාජ ක්‍රියාකාරීන්ට ලැබුනේ කුඩම්මාගේ සැළකිලි බවද අසන්නට ලැබුණි. එසේම වගකිවයුතු බොහොමයක් සංවිධාන හා පුද්ගලයන් ලබාදුන් අදහස් උදහස් ඉතා සහාසික ලෙස නොසලකා හරිමින්, යටත් පිරිසෙයින් නම හෝ සඳහන් නොකරන්නට මේ කමිටුව කටයුතු කර තිබේ.

මේ කමිටුව විසින් ''කන්දක් විළි විඳ වැදූ'' වාර්තාවේ සියලු දෑ සාකච්ඡා කරන්නට නොවෙහෙසෙමු. එහෙත් මේ රටේ පොදු මහජනතාවගේත්, විශේෂයෙන්ම සිංහලයන්ගේ දැනුම්වත්වීම පිණිස කරුණු කිහිපයක් පමණක් සඳහන් කරමු.

- කමිටු සාමාජිකයන්ගෙන් 7 දෙනෙකු නව ජාතික ධජයක් සම්පාදනයට යෝජනා කරයි. එසේම 2000 හා 2004 ව්‍යවස්ථා කෙටුම්පත් වල ජාතික ගීය සම්බන්ධයෙන් ඇති යෝජනා සැලකිල්ලට ගනිමින් සිංහලෙන් හා දෙමළෙන් ගයන්නටද යෝජනා කරයි.
- දෙදෙනෙක් හැර සියල්ලන්, නාමිකව හෝ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනැමෙන 9 වන ව්‍යවස්ථාව ඉවත් කිරීමට යෝජනා කර ඇත.
- සිව් පුද්ගල ඉඩම් කොමිසමක් යෝජනා කරන කමිටුව එහි එක් සිංහල නියෝජිතයකුද, එක් මුස්ලිම් නියෝජිතයකුද, එක් දෙමළ නියෝජිතයකුද, කඳුරට දෙමළ ජනතාව වෙනුවෙන් තවත් එක් නියෝජිතයකුද පත්කිරීමට යෝජනා කරයි. එවිට සිවු පුද්ගල කමිටුවේ දෙමළ ජාතිකයින් දෙදෙනෙකි. මුස්ලිම් නියෝජිතයාද සමග අසිංහලයින් තිදෙනෙක් ඉඩම් කොමිසමේ වෙති.
- අධ්‍යාපන ක්‍රියාවලිය තුළ 'ගෝලීය ආගමක්' ප්‍රවර්ධනය කිරීම ආදිය මුළුමනින්ම දීර්ඝ කාලයක සිට යුනිසෙෆ් ඇතුළු තවත්

එන්.ජී.ඕ නඩ විසින් සිහින දුටු බෞද්ධ අනන්‍යතාව විනාශ කිරීමේ උපක්‍රම මිස වෙන මොනවාද?

- ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත්කරන්නට ද යෝජනා කරයි. අනාගමික රාජ්‍යයක් ඉල්ලා මහජනතාව අරගල කරන්නට පටන් ගත්තේ ක්‍රිස්තියානි පල්ලියේත් කුරාණයෙත්, ගීතාවේත් ඇතැම් ඉගැන්වීම් ම්ලේච්ඡ ලෙස මනුෂ්‍යයින් පාලනයට වඩා මර්ධනයට පාලකයන් විසින් යොදා ගත් බැවිණි. බෞද්ධ රාජ්‍යයක් යනු ඔය කියන ආගමික රාජ්‍යයක් නොවේ. මේ බෙදුම්වාදී කමිටු වාර්තාව උත්සහ කරන්නේ අනාගමික රාජ්‍ය පදයට මුවාවී ථේරවාදය අතුගා දැමීමේ බටහිර අවශ්‍යතාව ඉටුකිරීමටය.
- උතුර හා නැගෙනහිර පළාත් වල සිංහල ජනයා පදිංචි කිරීහෙන් ජන අසමතුළිතතාවක් ඇතිබූ බව මෙම වාර්තාවේ මහත් අවධාරණයෙන් දක්වා ඇත. එහෙත් දහසය වන සියවසෙන් පසුව හා මෑත යුගයන්හිදී යාපනය මඩකලපුව ආදී ප්‍රදේශ වලින් එලවාදැමූ දස දහස් ගණන් සිංහල පවුල් ගැන වදනකුදු නොකීමට කමිටුව 'ප්‍රවේසම්' වී ඇත.
- කමිටුව විසින් නව ව්‍යවස්ථාවට සමලිංගකත්වය ගැන බරපතල ලෙස සිතන්නට නිර්දේශ කරන්නේ මෙසේය. "වයස සම්පූර්ණ වී ඇති සියලු පුද්ගලයින්ට ජනවර්ගය, ජාතිය, ආගම, ලිංගික අනන්‍යතාව, ලිංගික නැඹුරුව ආදීයේ සීමාවකින් (සම ලිංගික, ද්වී ලිංගික, පාර ලිංගික, හා අන්තර් ලිංගික, නාරි මෛථුන්‍යය) තොරව විවාහ වීමට හා පවුලක් සෑදීමට අයිතිය තිබේ. ඔවුනට සමාන අයිතිවාසිකම් ලැබිය යුතුය.

අනාගමික රාජ්‍යය පිළිබඳව කමිටුව පවසන එක් හාස්‍ය ජනක, එහෙත් වැදගත් කරුණක් තිබේ. එය එක් අතකින් කමිටුව නිරුවත් කරන්නේ ය; අනෙත් අතින් මේ සටකපට දේශපාලන අඩව්වේ සැබෑ බරපතලකම හෙළිදරව් කරන්නේය. "අප පෞද්ගලිකව අනාගමික රාජ්‍යයකට කැමති නමුත් මහජනතාව ඉදිරිපත් කළ විවිධ අදහස් අනුව අපට පෙනී ගියේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම වගන්ති වෙනස් කිරීම අනවශ්‍ය ගැටුමකට හේතුවක් විය හැකි බවත් එය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට බලපෑ හැකි බවත්ය" මෙහිදී මෙම

කොමිසම (හෝ ඔවුන්ගේ ස්වාමීන්) වඩාත් බිය වී ඇත්තේ මහා සංඝයා වහන්සේ පෙරටු කරගත් සිංහල බෞද්ධයින් මෙම ව්‍යවස්ථාවට විරුද්ධ වීමෙන් බෙදුම්වාදය ශක්තිමත් කරන සෙසු යෝජනාද කුණු කූඩයට යෑමට ඉඩ ඇති නිසාය.

නමුත් ජාතික කොඩිය වෙනස් කිරීම මෙන්ම ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම යන කාරනා වලදී කමිටුව නොබියව අදහස් ඉදිරිපත් කොට ඇති බව පෙනේ. වෙස්ට්මිනිස්ටර් අගමැති ප්‍රධාන පාලන තන්ත්‍රයක් ඇති කිරීම, දෙමළ හා මුස්ලිම් ජන වර්ග නියෝජනය කරන උප ජනාධිපති ධූරයක් ඇති කිරීම, යන කාරණා වලට විශේෂ තැනක් දෙමින් එම යෝජනා පැහැදිලි කරමින් මෙම කමිටුව ප්‍රභල ලෙස සිය යෝජනා ඉදිරිපත් කර ඇත.

නීති සම්පාදනයේ, ක්‍රියාත්මක කිරීමේ හා යුක්තිය පසිඳලීමේ ජනතා පරමාධිපත්‍යය බලය, අන් අයෙකුට හෙවත් තෝරා ගන්නා නියෝජිතයකුට ලබා දීමේදී, තමා පත් කරගන්නා නියෝජිතයා සුදුසුද නුසුදුසුද යන්න තීරණය කිරීමේ බලය රටේ ජනතාවට සමව හිමිවිය යුතුය. එක් දිස්ත්‍රික්කයකින් පත්වන මන්ත්‍රීවරයකු, මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත රටේ අග්‍රාමාත්‍යවරයා වුවද, පූර්ණ විධායක අග්‍රාමාත්‍ය ක්‍රමයේදී තමන් පාලනය කරන විධායකය පත්කර ගැනීමේ බලය රටේ ජනතාවට සමව හිමි නොවේ. ඔහු හෝ ඇය පත්කර ගන්නේ රටේ එක් දිස්ත්‍රික්කයක ජනතාව විසින් පමණි.

ව්‍යවස්ථානුකූලව එය නිවැරදිය. 1970 වන විට පූර්ණ විධායක අග්‍රාමාත්‍යවරිය ලෙස පත්වන බණ්ඩාරණායක මහත්මිය ජාතික රාජ්‍ය සභාවට පත්වන්නේ සමස්ථ රටේ 5,505,028 වූ ඡන්ද දායකයින් අතුරෙන් අත්තනගල්ල ආසනයේ වලංගු ඡන්ද සංඛ්‍යාව වූ 48,908 අතුරෙන් 31,612 ක් පමණක් ලබා ගෙනය. මේ තත්ත්වය ඉක්මවා ගිය ක්‍රමවේදයකින් රටේ විධායකය තෝරාගත යුතුය, එනම් සිය විධායකය තෝරාගැනීමේ අවස්ථාව රටේ සියලු පුරවැසියන්ට හිමිවිය යුතුය යන සංකල්පය බිහිවන්නේ බොහෝ ‘ප්‍රජාතන්ත්‍රවාදී’ රටවල් පවා අද වන විට විධායක අගමැති ක්‍රමය ප්‍රතික්ෂේප කර ඇති තත්ත්වයක් තුළය.

ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය ස්ථාපනය වන්නේ රටකට ස්ථාවර විධායකයක අවශ්‍යතාව අවධාරණය කරමිණි. එහිදී ප්‍රතික්ෂේප වූයේ විවිධ උපාය උපක්‍රම මගින් පාර්ලිමේන්තුවේ (විශේෂයෙන්ම සුලුජාතික අන්තවාදීන්ගේ) ප්‍රාණ ඇපකරුවකු බවට පත්වන්නට ඉඩ ඇති අග්‍රාමාත්‍ය ධූරය තීරණාත්මක අවස්ථා වලදී කෙතරම් අවදානම්ද යන තත්ත්වයයි. ඇත්ත වශයෙන්ම විධායක අගමැතිධූරයක මුවාවෙන් පැමිණෙන දේශපාලන ප්‍රතිසංස්කරණයක් යනු මේ රටේ බෙදුම්වාදී බලවේග වල ඓතිහාසික ජයග්‍රහණයකි. 1978 වන විට විධායක අගමැති ක්‍රමය න්‍යායාත්මකව හා දේශපාලනිකව ප්‍රතික්ෂේප කර නව දේශපාලන සම්ප්‍රදායක් ඉදිරිපත් කළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අද වන විට යළිත් ඒ 'යල්පිනූ' විධායක අගමැති ක්‍රමය ඉල්ලා සිටින්නේ ඇයි? ඒ සඳහා ඔවුනට ඇති සදාචාරාත්මක අයිතිය කුමක්ද?

පැරදවිය යුතු කුමන්ත්‍රණය නම් අන්තවාදී, වර්ගවාදී, මූලධර්මවාදී, බලවේග විසින් මේ රට බෙදීම දක්වා වන වැඩ පිළිවලයි. මේ රටේ තක්කඩි දේශපාලනඥයින් විසින් ජනතාවගේ සැබෑ ප්‍රශ්න හා ජාතික අර්බුධය අමතක කර විධායක අගමැති ක්‍රමය ආදී බහුබූත කියවමින් ඊනියා ව්‍යවස්ථා සංශෝධනයක නාමයෙන් කුමන්ත්‍රණයක් කිරීමේ අභිප්‍රායයි. 1994දී පටන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව මේ රටේ ප්‍රධාන මැතිවරණ, විශේෂයෙන්ම ජනාධිපතිවරණ වලදී කළ එළි බසින්නේය. 2000 වසරේදී චන්ද්‍රිකා බණ්ඩාරණායක මහත්මිය ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කළාය. එහෙත් එය සාර්ථක ලෙස සම්මත නොවීය. පසුව මහින්ද රාජපක්ෂ යුගයේ 'ජාතික ප්‍රශ්නය' දේශපාලනිකව විසඳීමේ ක්‍රමවේදය ලෙස යෝජනා කෙරුණු සර්වපාක්ෂික සමුළුවද තවත් ව්‍යවස්ථා කෙටුම්පතක් සකසන්නේය. කෙසේ වෙතත් මේ අවස්ථා ද්වයේදීම 'නව ව්‍යවස්ථා කළලය' උපන් ගෙයිම මිය ගියේය. එහෙත් ව්‍යවස්ථා සංශෝධන සාර්ථකව සිදුකෙරුණු අවස්ථා කීපයක් මෑත දේශපාලන ඉතිහාසය තුළ ඇත. ඉන් එක් අවස්ථාවක් වන්නේ 1977දී ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් 1972 ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා ජනතා බලය ඉල්ලනු ලදුව 5/6ක බලයක් සහිතව ජයග්‍රහණය කිරීමයි. එසේම සිරිමාවෝ බණ්ඩාරණායක මහත්මිය 1970 වකවානුවේදී ව්‍යවස්ථාවමය වශයෙන් යටත් විජිත ග්‍රහණයෙන් මිදිය යුතුය යන යෝජනාව සහිතව ජාතික රාජ්‍ය සභාව ජයග්‍රහණය කිරීමයි. අද වනවිට ඇත්තේද මේ කතිකාවතමය. යටත්

විජිත ග්‍රහණයෙන් මිදුනේ යැයි කීවද 1948 සිට අද දක්වාම රට පාලනය කිරීම සඳහා සුදුසු වැඩ පිළිවලක් සකසා ගැනීමට අපි අසමත්වී ඇත්තෙමු.

**<u>මේ ව්‍යවස්ථා නාඩගම ක්‍රියාත්මක වන්නේ සිංහලයාගේ අභිමානය බිඳිය යුතුය යන ඒකායන අරමුණ පෙරදැරි කරගෙන බව අපි වගකීමෙන් කියන්නෙමු. එහෙයින් ව්‍යවස්ථා සංශෝධන නාඩගම සමාජගත කෙරුනු මේ වකවානුව අපි ගැඹුරින් හඳුනාගත යුතුය.</u>**

සිංහල ප්‍රභූන් සුද්දා සමග 1815දී ඇති කරගත් උඩරට ගිවිසුම නම් සුප්‍රසිද්ධ ලියැවිල්ලට අත්සන් තබා 2015ට වසර දෙසියයකි. වඩුග පාලන තන්ත්‍රය විසින් සවිඥානික හා දේශපාලනික සිංහලයන් සමූල ඝාතනය සනිටුහන් කළ මද්දුම බණ්ඩාර නම් අභිත සිංහල පැටවා ඝාතනය සිදුවන්නේ ඊට වසරකට පෙර එනම් 1814දීය. 2014 වසරට එය සිදුවී වසර දෙසියයකි. සිංහල මරක්කල කෝලහලය නමින් ප්‍රසිද්ධවූ ගැටුම උද්ගතවී 2015ට වසර සියයකි. සමස්ථ සිංහලයම අන්‍ය දේශයක යටත් විජිතයක් කරමින් රාජ රාජ චෝලගේ පුත් රාජේන්ද්‍ර රාජ චෝල අනුරාධපුරයේ බලය ඩැහැ ගන්නේ ව්‍යවහාර වර්ෂ 1017දීය. ළඟ එන 2017දී එහි සහශ්‍ර වර්ෂ පූර්ණය සමරන්නට දෙමළ බෙදුම්වාදයේ න්‍යායාචාර්යයෝ දත කට මැද ගෙන සිටිති. ඒවා 'සාර්ව' තත්ත්වයන්ය. අපි 'ක්ෂුද්‍ර' තත්ත්වයන් ද තේරුම් ගනිමු.

ව්‍යවස්ථා සංශෝධන 'මගඩි නාටකයේ' මහජන අදහස් විමසීමේ 'ජවනිකාව' තුළ සැළසුම් සහගතව සිදුවූ දේ බොහෝය. එයින් විශේෂයෙන්ම උතුරේත් නැගෙනහිරත් බෙදුම්වාදී හා අන්තවාදී පාර්ශවයන්ගේ 'යෝජනා ඉදිරිපත් කිරීමේ සංදර්ශන' බරපතල ලෙස මාධ්‍ය හා වෙනත් උපක්‍රම මගින් උලුප්පා දැක්විණි. එසේ ජනප්‍රිය වූයේ විග්නේශ්වරන් නව ව්‍යවස්ථාවට ඉදිරිපත් කිරිම සඳහා උතුරු පළාත් සභාවේ සම්මත කළ යෝජනා වලිය නියෝජ්‍ය කතා නායකට භාරදීම පමණක් නොවේ. වවුනියාවේ හා මන්නාරමේ කාන්තා සංවිධාන දෙකක් වර්තමාන ජාතික ධජයේ සිංහයා ඉවත් කළ යුතුයැයි යෝජනා කළේය. දෙමළ ජාතික සංධානයේ බෙදුම්වාදී යෝජනා වලිය සමග අදහස් දක්වන

එහි පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන් කිවේ 'ෆෙඩරල්' අදහස දෙමළ ජනතාවගේ හෝ නායකයන්ගේ නොවන අතර එය සිංහල (උඩරට) ප්‍රභූන් 1931දී ඩොනමෝර් හා 1946දී සෝල්බරි කොමිෂන් සභාවලින් ඉල්ලූ බෙදීමක් බවය. එහෙත් සිංහලයන් ඒ පරජාතික කොමිෂන් වලින් ඉල්ලූයේ උතුරු නැගෙනහිර ඒකාබද්ධ කළ දෙමළ කතා කරන රාජ්‍යයක් හෝ දකුනේ සිංහල රාජ්‍යයක් නොව, පරංගින් මේ රටට ගොඩ බසින්නට කලින් තිබූ, රුහුණු පිහිටි මායා ලෙස බලය බෙදීමක් බව සිහිපත් කරනු කැමැත්තෙමු. බොහොමයක් සිංහල සංවිධාන ඒ යෝජනාව නිති විරෝධී මෙම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කොමිසමටද ලබාදුන් බවද සඳහන් කරන්නෙමු.

ජාතික පුවත්පත් වල පිටු පුරා පළකරමින් විග්නේශ්වරන් මහ ඇමතිවරයා ඉදිරිපත් කළ ෆෙඩරල් යෝජනා වලියේ 'ඇඟ කිළිපොලා යන' මූලික ලක්ෂණ සළකා බැලීම වැදගත්ය. භාෂාව පදනම් කරගත් දෙමළ රාජ්‍යයක් උතුරේ හා නැගෙනහිරද, සිංහල පදනම් කරගත් සිංහල රාජ්‍යයක් දකුනේද ඇති කිරීම මත පදනම්වී ඇති මේ යෝජනා වලිය, උතුරු හා නැගෙනහිර පළාත් වල මුස්ලිම් ජනතාව සඳහා වෙනම ස්වාධීන පරිපාලන ඒකක ලබාදීමට යෝජනා කරයි. ඒකාබද්ධ කරනු ලබන ප්‍රාන්තයට උතුරු නැගෙනහිර වෙනම පාර්ලිමේන්තුවක් දෙමළ බෙදුම්වාදය ඉල්ලා සිටී. ස්වාධීන පරිපාලන ඒකක හා ප්‍රාන්ත රාජ්‍යයට ස්වයං නිර්න අයිතිය ලබාදීමද, ප්‍රාන්ත රාජ්‍යයේ කටයුතු සඳහා මධ්‍යම රජයේ මැදිහත්වීමද ප්‍රතික්ෂේප කිරීමද, ජාතික ධජයෙන් 'වාර්ගික නිරූපයන්' ඉවත් කිරීමද පූර්ණ පොලිස් හා ඉඩම් බලතල ලබාදීමද, හමුදා ඉවත් කිරීමද, දේශපාලනික කරුණු සඳහා වෙනම ජනමත විචාරන පැවැත්වීමේ බලයද ඒ යෝජනා වලිය ඉල්ලා සිටී. අපට අසන්නට ඇත්තේ සරල පැනයකි. මෙය නව ව්‍යවස්ථාවක් සඳහා වන යෝජනා මාලාවක්ද; නැතහොත් එල්.ටී.ටී.ඊ සංවිධානයේ න්‍යාය පත්‍රයද?

බෙදුම්වාදයේ මිලිටරි පරාජය සනිටුහන් වූයේ 2009දී ප්‍රභාකරන්ගේ අවසානයද සමගය. එහෙත් 2013 වසරේ නොවැම්බරයේ ඊනියා මහවිරු දින කතාව පාර්ලිමේන්තුවේදී සිදුකිරීමට තරම් යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ශ්‍රී ධරන් සමත් වෙයි. එය හෙළා දැකීමට එවකට සිටි නායකයෝ හෝ පාලකයෝ කටයුතු කළෝද? අපි දැන් ඊළම

දිනාගන්නේ ආයුධ රහිත යුද්ධයකින් යැයි පාරම්බාන දෙමළ බෙදුම්වාදයේ දේශීය හා විදේශීය ඒජන්තයන්ගේ 'උදාන වාක්‍යය' අරුත් රහිත, පණිවිඩ රහිත ඒවා නොවේ. විජයකලා මහේෂ්වරන් නම් යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය එක්තරා මාධ්‍ය ආයතනයක වැඩසටහනකදී එල්.ටී.ටී.ඊ සමයේ යාපනයේ කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු විණැයි කීවේ කොළඹදීය. එසේ කියා වසරක් යන්නටත් පෙර, යාපන දිස්ත්‍රික්කයේම දේශපාලනයට සම්බන්ධ කාන්තාවක් කීවේ 'අපට ඉඩම් බලතල නුදුන හොත් යලිත් ආයුධ අතට ගන්නා බවය'.

නාගදීපය වන්දනාවේ ගිය ගාල්ල දිස්ත්‍රික්කයේ පිරිසකට, යාපනයේ අරියාලේදී ගල් වදින්නේය. ඒවා යාපනයේ ලාබාල ගැටවුන් වඳුරන්ට ගැසූ ගල් නොවේ. ප්‍රභාහරන් මළ දා පහන් පත්තු කරන්නේ හුදෙක් යුද්ධයෙන් මියගිය අය සිහිපත් කරන්නටැයි කියා එහි ඇති බෙදුම්වාදී බවෙහි 'සැර බාල කිරීමට' උත්සහ දැරීම අපට තේරුම් ගත හැක. එහෙත් යාපනය විශ්ව විද්‍යාලයේ සිසුන් යැයි කියාගන්නා ඊළඟ ඊළාම් යුද්ධයේ සෙබලුන්, ඒ ඊනියා සැමරුම කරන්නේ ඊළාම් රාජ්‍යයේ සිතියමක් පසුබිමේ තබා ගනිමිනි. දෙමළ ජාතික සන්ධානයේ නායක, නූතන නිතී විරෝධී පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කිලිනොච්චි පරවි පරිච්චාන් යුධ හමුදා කඳවුර තුළ ඊළාම්වාදීන් ඉඩම් හොයන්නට යන්නේ අත්වැරදීමකින්ද? මැයි 18 විරු සමරුව අවලංගු කරමින් ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි ප්‍රකාශ කරන්නේ 'යුද්ධය මේ රටේ ජන වර්ග දෙකක් අතර ඇති වූවක් නිසා එහි ජය සැමරීම නුසුදුසුයි' කියාය. ඉතින් උතුරු පළාත් මහ ඇමති විග්නේශ්වරන් නම් ජරපත් දේශපාලනඥයා මුලතිව් සම්බෝධි විහාරය නීති විරෝධීයි, එය ඉවත් කරගන්නැයි කීම පුදුමයට කරුණක්ද?

අතිශය ප්‍රජාතන්ත්‍රවාදී 'මහජන අදහස් විමසීමකින්' ව්‍යවස්ථා කෙටුම්පතක් ජනගත කරන්නට තතනන වෛවර්ණ ආණ්ඩුව කෙබඳු ව්‍යුහයක්ද? මහජනතාව විසින් ප්‍රතික්ෂේප කර දැමූ පරාජිත දේශපාලනඥයින් වෙනත් හොර පාරවලින් පාර්ලිමේන්තු ගත කිරීමේ 'සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයම' ආණ්ඩුවේ ඇති අනෛතිකභාවය ප්‍රකට කරයි. එබඳු වංචනික රජයකින් යුක්තියක් බලාපොරොත්තු විය හැකිද? තමා ජනාධිපති මන්දිරයේ වාසය නොකරන්නේ ඒ සඳහා වියදම් වන අධික

මුදල නිසායැයි ප්‍රසිද්ධියේ කියාපාන ජනාධිපතිවරයාගේ නීලපට දර්ශනයෙන්, ඇමති වාහන සඳහා රුපියල් කෝටි 118ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කරන්නට උත්සහ දරන දේශපාලන හෙළුව වසාගත හැකිද? රවටන්නට හදන්නේ කාවද? මේ මගඩි නාටක අස්සේ ව්‍යවස්ථා සංශෝධනය යන නමින් කළඑළි බසින්නේ මගඩි නාටකයක්ම බව අපි වගකීමෙන් කියන්නෙමු.

1970 දශකයේ සිදුවූ ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩල පත්කිරීම් හා වෙනත් බල දෝලනය වීම් වලදී මේ රටේ වගකිවයුතු මහානායක අනුනායක ස්වාමීන් වහන්සේලාගේ හැසිරීම හා මැදිහත්වීම උන් වහන්සේලා කෙරෙහි අප තුළ ඇති කරන්නේ මහත් ගෞරවයකි. එකල ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය අමතා ‘සිංහල ජාතියේත් සම්බුද්ධ ශාසනයේත් අනාගතය සම්බන්ධ ස්ථිර පැහැදිළි පදනමක් මත අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය වනු දැකීම සිංහල බෞද්ධ ජනතාවගේ ප්‍රාර්ථනය වී ඇත’යි කීමට එදා මල්වතු අස්ගිරි මහ නාහිමියෝ ඒකාබද්ධ සංදේශයකින් කියා සිටියහ. රජයට අනුශාසනා කිරීමට සඟරුවනේ මූලිකත්වයෙන් උත්තරීතර රාජ්‍යානුශාසනා මණ්ඩලයක් පිහිටුවන්නැයි රජය අමතා කීමට වයඹ ත්‍රෛනිකායික සංඝ සභාවට හැකියාව තිබුණි. ලංකාවේ එකම රාජ්‍ය භාෂාව සිංහල විය යුතු යැයි කියන්නට රාමඤ්ඤ මහා නිකාය කටයුතු කර තිබුණි. අද මුළුමනින්ම මේ නායක කාරකාදී භික්ෂූන් වහන්සේ අකර්මන්‍යයැයි අපි නොකියමු. එහෙත් අතීතය හා සසඳන කළ සමස්ථයක් ලෙස සංඝ සමාජයේ අප දකින නිෂ්ක්‍රියත්වය හා බින්නතාව අප තුල ගම්‍ය කරන්නේ වේදනාවකි.

ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරයේ කැමැත්තය. අපේ රටේ බහුතරය කවුරුන්ද? ජාතියක් වශයෙන් නම් සිංහලයන්ය. ආගමක් වශයෙන් නම් බෞද්ධයන්ය. එහෙත් 1505 ඇරඹූ සිංහලයන් හා බෞද්ධයින් බහුවිධ ආකාරයෙන් සංහාරය කිරීම අද වන විට මේ රටේ පරම උරුමක්කාර ඓතිහාසික ජාතිය කරුමක්කාර නිෂ්ක්‍රිය ජාතියක් බවට පත්කර තිබේ. 1948 දක්වා ක්‍රමයෙන් සිදුවූ සිංහල බෞද්ධයන් වාර්ගිකව, හා දේශපාලනිකව සංහාරය කිරීම අයිවර් ජෙනිංග්ස්ගේ උපාය අනුව ප්‍රධාන පක්ෂ දෙකකට කඩනු ලදුව සාර්ථක ප්‍රතිඵල නෙළා ගත්තේය. ඉදින් සිංහලයාගේ එක්වීම කිසිදා සිදු නොවන තරමටම අසම්භව්‍යය. ඒ නයින්

පාලන බලය බහුතර සිංහලයා සතුවීම තබා, පාලක පක්ෂය හා විපක්ෂය තීරණය කිරීමේ බලයවත් සිංහලයා සතු නොවේ. රජුන් තනන්නේ එක්කෝ අන්තවාදීන්ය; නැත්නම් බෙදුම්වාදීන්ය; ඒත් නැත්නම් සමාජවාදීන් ය.

දෙමළ ජනවර්ගය නියෝජනය සඳහා නායකයින් කීප දෙනෙකු හෝ එක් අයකු සිටිති. මුස්ලිම් ජනවර්ගය සම්බන්ධයෙන්ද තත්ත්වය එසේමය. ඒ හේතුවෙන් දේශපාලනිකව බලය සම්බන්ධ ගනුදෙනු වලදී ඒ නායකයින් සතුව කේවල් කිරීමේ හැකියාවක් ඇත. සිංහලයා වෙනුවෙන් කේවල් කරන්නේ කවුද? ජනාධිපති හෝ අගමැති හෝ වෙනත් අයෙක් නාමමාත්‍රිකව සිංහල වූ පමණින් ඒ අය ජාතිය නියෝජනය කරන්නේද? කිසිසේත්ම නැත. සිංහල විද්වත් එකමුතුවේ විග්‍රහය ප්‍රකාරව, ජනාධිපතිවරයා හෝ සෙස්සන් ජාතියේ නායකයින් නොවේ. ඔවුන් රාජ්‍ය නායකයින්ය. ඒ සියල්ලන් ජනතාව (වෙසෙසින් සිංහලයින්) රවටන ඊනියා මැතිවරණ ක්‍රමයකින් පත් කළ බටහිර අධිරාජ්‍යවාදයේ නියෝජිතයින්ම පමණකි. ඒ නයින් ගත් කළ ව්‍යවස්ථාව යනු ඒ අයගේ රැකියා කාර්ය ලැයිස්තුවයි. ව්‍යවස්ථාව යනු සිංහලය සූරා කෑමය හෝ තමන්ට අභිමත පරිදි පාලනය කිරීමට ධවල චර්මධාරීන්ගේ බෝල්-පොයින්ට් පෑනකින් කටුගෑ ලියවිල්ලකි.

"වෙල්ලස්ස" යනු 1818 සිංහල නැගිටීමේදී වෙල් (එනම් කුඹුරු) ලක්ෂයක් විනාශ කළ ස්ථානයයැයි ජනප්‍රවාද කියයි. වර්තමාන රජය මීට මාස කීපයකට පෙර පාර්ලිමේන්තුවේ සංවාද කළේ අපේ රටේ වී වගාව හෙක්ටෙයාර් 100,000කින් අඩු කිරීමටය. ඒ සඳහා වෙනත් බොහෝ කුමන්ත්‍රණද ක්‍රියාත්මක කර ඇත. එදා වෙල් ලක්ෂයත්, අද (ඒකකය කුමක් වුවත්) වෙල් ලක්ෂයත් අතර ඇත්තේ දෛවෝපගත සම්බන්ධයක් නොවේද? අප කියන්නේ මේ වකවානුවේ සිංහලයේ පාලන බලය 1818දී පාලනය කළ බ්‍රවුන්රිග්ලාගේ, විල්සන්ලාගේ මුණුබුරු මිණිබිරියන් අත පත්ව ඇති බවකි. උන් සිංහල රූපයෙන් ඉපිද, බාගදා සිංහල පන්නයට අඳිනවා පළඳිනවාද විය හැක. බ්‍රිතාන්‍යයේ ජීවත් වන ගණනින් ලක්ෂ තුණක් පමණ වූ දෙමළ සුළුතරයට බ්‍රිතාන්‍යයේ කොන්සවේටිව් හා කම්කරු පක්ෂය හිස නමන්නේ ඒ ඡන්ද ලක්ෂ දෙක තුන ස්වකීය පක්ෂය ජයග්‍රහනය කරවීමේදී තීරණාත්මක බැවිණි. ඒ අනුසාරයෙන් දෙමළ

ඩයස්පෝරාව උපරිම වාසි ලබා ගන්නේය. අපේ රටේද පාලන බලය දිනාගැනීම උදෙසා දෙමළ හා මුස්ලිම් සුළුතරයට හිස නමන එක්සත් ජාතික පක්ෂ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හෝ වෙනයම් පක්ෂයක ඊනියා නායකයින් යනු සිංහල නමින් උපන් සුද්දෝම ය.

සියලු අවක්‍රියා 'ඉවසමින්' වෛවර්ණ ආණ්ඩුවේ විධායකයේ ප්‍රධානියත් ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියාත් කරන්නේ මුණිවත රැකීමය. ඇත්ත වශයෙන්ම මෙවැනි ප්‍රශ්න වලදී ස්වකීය පාලනය තුළ සිටින කවරකු හෝ වුවද පාලනය කළ යුත්තේ ඔවුන්ය. එහෙත් මුස්ලිම් අන්තවාදයේ නියෝජිතයෝද, දෙමළ බෙදුම්වාදයේ නියෝජිතයෝද හිතූ හිතූ දේ කියති; කරති. වගකිවයුත්තන්ගේ මුණිවත නිසා පොදු මහ ජනයා හෝ විශේෂයෙන්ම සිංහල හා සිංහල බෞද්ධ සිවිල් සමාජ ක්‍රියාකාරීන් (සාමාන්‍යයෙන් මොවුන් හඳුන්වන්නේ ජාතිවාදීන් ලෙසය) ඒ ඒ තත්ත්වයන්ට, ප්‍රකාශයන්ට, ක්‍රියාවන්ට ප්‍රතිචාර දක්වන්නට යයි. එය බොහෝ විට තවත් 'කළු ජූලියකින්' කෙළවර වන්නට පිළිවන. එසේ නම් ඊනියා ව්‍යවස්ථාදායකයත්, විධායකයත් බලා සිටින්නේ තවත් කළු ජූලියක් උදා වන තුරුද? යුරෝපයේ මහළු යටත් විජිතවාදයෙන්ද, ඇමරිකානු මදාවි අධිරාජ්‍යවාදයෙන්ද, කුලප්පු වී සිටින ඉන්දියානු වානිජ ව්‍යාප්තවාදයෙන්ද එසේ කරන්නැයි වර්තමාන රජයට අණ ලැබී ඇතැයි අපි අනුමාන කරමු. ඒ 'කළු ජූලිය' අස්සේ මෙවර සූදානම් වන්නේ සිංහල බිලි 100,000ක් වත් ගෙන (මන්ද 1971දී 20,000ක් ද 1988-89දී 66,000ක්ද විණි නම් අද එය 100,000ක් වත් විය යුතුය) ඒ පුළුටු ගඳ මැද පැනෙන් රට බෙදා බෙදුම්වාදයේ ප්‍රීති උත්සවය සමරන්නටද?

එහෙයින් සියලු ක්‍රියාකාරී සිංහල සංවිධාන, හා බලවේග වලින් මෙන්ම සියලු සිංහලයන්ගෙන් ඉල්ලා සිටින්නේ මොනම හේතුවක් නිසාවත් ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් කරා තල්ලු නොවන ලෙසය. එසේ වුවහොත් එය බරපතල අත්වැරැද්දක් වන අතරම, සිංහලයාගේ ජයග්‍රහණ තවත් කාලාන්තරයකට කල් දැමීමක්ද වනු ඇත. ව්‍යවස්ථා සංශෝධන උගුලෙන් රට මුදා ගැනීම ප්‍රමුඛ කරගත් තවත් පොදු ජාතික අභිලාෂයන් ඉෂ්ට කර ගැනීම පිණිස අප පළමුව සිංහලයාගේ අයිතීන් වෙනුවෙන් රටේ පාලකයන්ට බලකළ යුතුය. දෙමළ බෙදුම්වාදය හා මුස්ලිම් අන්තවාදය සමග අප සෘජුව ගැටුමට යෑම කූට පාලකයාද ඔහුගේ තැරැව්කරුවෝද

අපේක්ෂා කරති. ඒ ඔහුගේ ආරක්ෂාව පිණිසත් අපේ විනාශය පිණිසත්ය. අපි ඒ උගුලට හසු නොවන්නට ඉටා ගනිමු.

අවසාන වශයෙන් අපි පහත සඳහන් කරුණු මේ මගඩි නාටකයේ වගකිව යුත්තන්ගෙන් විමසමු!

- **පළමුව සමස්ථය සලකා බැලීමේදී මෙම ව්‍යවස්ථා සම්පාදන කමිටු වාර්ථාව ප්‍රධාන කරුණු දෙකක් මත දෝලනය වන බවක් පෙනෙන්නට තිබේ. පළමුවැන්න මේ ඓතිහාසික දේශයේ සිංහල බෞද්ධ අනන්‍යතාව නසමින් බෙදුම්වාදයට පාර කපන නැඹුරුතාවයය. දෙවැන්න නම්, මේ දේශයේ සංස්කෘතිය බරපතල ලෙස සොලවාලමින් සමලිංගිකත්වය වැනි විෂමාචාරයන් සඳහා නෛතික පදනමක් ලබාදීමට දරා ඇති උත්සහයයි. මේ ඊනියා ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට නායකත්වය දෙන්නේ පවතින 'යහ පාලන' රජයයි. ඉන් කියැවෙන්නේ මේ ආණ්ඩුවේ රාජ්‍ය පාලන මූලධර්ම වී ඇත්තේ බෙදුම්වාදය හා දුරාචාරී ලිංගික විෂමාචාරයන් බවද?**

- **දෙවනුව, ඇතැම් වගකිවයුතු සිංහල හා සිංහල බෞද්ධ සිවිල් සංවිධාන හා ක්‍රියාකාරීන් විසින් කොළඹදී හා දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් ලබාදුන් යෝජනා මේ වාර්ථාවේ ඇතුළත් නොවීමය. ඇතැම් පුද්ගල හා සංවිධාන නාම සඳහන් වුවද ඒ යෝජනාවන්හී සාරය වාර්තාවට ඇතුළත්වී නැත. ඒ පිළිබඳ සාක්ෂි අප සතුය. එසේ රට පුරා ලබාදුන් යෝජනා හා අදහස් විශ්ලේෂණය කර රාජ්‍යයේ ස්වභාවය,පුරවැසි භාවය, ආගම සහ මූලික අයිතිවාසිකම්, භාෂා අයිතිය, රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූල ධර්ම, උත්තරීතර සංඝ මණ්ඩලය,**

**විධායකය, බලය බෙදා හැරීම, මැතිවරණ ක්‍රමය, වෙනත් යෝජනා යන ශීර්ෂ දහය ඔස්සේ ඒවා අප විසින් සාරංශ ගත කර තිබේ. ඒ කිසිවක් මේ කමිටු වාර්තාවේ අන්තර්ගත වී නැත. එහෙයින් මෙය හුදෙක් බෙදුම්වාදීන්ගේ අවශ්‍යතාව මත, බොරු ප්‍රජාතන්ත්‍රවාදී මහජන මත විමසීමක් සේ මවාපාමින්, සිදුකළ වංචනික ක්‍රියාවක් බව ප්‍රකාශ කරමු.**

- **තෙවනුව, සමස්ථ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය හා ලාල් විජේනායක කමිටු වාර්තාව සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂයේ ස්ථාවරය කුමක්ද? ඔවුන් නිහඬ ඇයි? ඒකාබද්ධ විපක්ෂය යනු පවතින රජයේ සැබෑ විපක්ෂය මෙන්ම, බෙදුම්වාදයේ මිලිටරි පරාජයට මූලික වූ දේශපාලන නායකත්වයේ වර්තමාන ස්වරූපයයි. යටත් පිරිසෙයින් ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති යෝජනා ගැන හෝ යමක් ප්‍රකාශයට පත්කරන්නට ඒකාබද්ධ විපක්ෂය අසමත්වීම පිළිබඳව මේ රටේ දේශමාමක ජනතාව පසුවන්නේ කුකුසෙනි.**

අපි යළිත් අවධාරණය කරමු. මේ සමලිංගික හා බෙදුම්වාදී කමිටු වාර්තාවේ ඒකායන අරමුණ හුදෙක් ජාතියේ ඉතිහාසය හා ථෙරවාදයේ චිරස්ථිථිය විනාශ කිරීමය. එහෙයින් මේ කුමන්ත්‍රණය පරාජය කිරීමේ මෙහෙවරට රටට, ජාතියට, ශාසනයට ආදරය කරන්නවුන් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පක්ෂය කුමක් වුවද, දේශපාලන දෘෂ්ටිවාදය කුමක් වුවද, කවර රැකියාවක නිරතව සිටියද කොන්දේසි විරහිතව එක් විය යුතුය.

**සකල ලෝකවාසී සිංහලයිනි, ලෝ සසුන් බැබළවීමට එක්වව්!**

**ත්‍රි සිංහලයට සදා ජය..!!**

# ව්‍යවස්ථා කුමන්ත්‍රණයට එරෙහි ජාතික සංවිධාන එකමුතුව